DON'T SWALLOW THE BAIT
Defeat Sexual Exploitation Online
Short Film Competition 2023

**Organized by the Sexual and Gender-Based Harassment and Sexual Violence Committee (SGBVC) together with the Alumni Association of the University of (AAUP)**
**Sponsored by Peradeniya University Alumni Australia -Victoria Chapter (PUAAViC)**

# කෙටි චිත්‍රපට තරගය 2023
# ඇම ගිලින්නෙපා! සයිබර් අවකාශයේ ලිංගික සූරාකෑම පරදමු

**කොන්දේසි හා මාර්ගෝපදේශනය**

**ඉදිරිපත් වීමේ සුදුසුකම්:** පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දැනට අධ්‍යාපනය ලබන උපාධි අපේක්ෂක ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විවෘතයි.

**අරමුණු:**

- කෙටි චිත්‍රපට මගින් විද්‍යාර්ථීන්ගේ ජීවිත රැකගැනීම සඳහා සයිබර් ලිංගික අපරාධකරුවන් වැළැක්වීම හා එරෙහි වීම යන තේමාව ආමන්ත්‍රණය කළ යුතුය.

- කෙටි චිත්‍රපට මගින් බලගැන්වීම, දැනුම්වත්භාවය හා මෙවැනි සිදුවීම් සමග ගනුදෙනු කිරීමේ ක්‍රමවේද යනාදිය ඉස්මතු කර දැක්විය යුතුය.

**කාලසීමාව:** කෙටි චිත්‍රපට විශේෂ ස්තුති කිරීම්ද ඇතුළත්ව විනාඩි 5කට නොවැඩි විය යුතුය.

**අන්තර්ගතය පිළිබඳ උපදෙස්:**

- කෙටි චිත්‍රපට අදාළ කාරණය පිළිබඳ සංවේදීභාවයෙන් යුතු හා ධනාත්මක වූත් බලගන්වනසුලු වූත් පණිවිඩයක් සහිත එකක් විය යුතුය.

- සයිබර් ලිංගික සූරාකෑම්වලට ලක්වන විද්‍යාර්ථීන්ට පවතින උපකාර සේවා, මූලාශ්‍ර හා ක්‍රමවේද පිළිබඳ දැක්විය යුතුය.

- යම් විශේෂිත සිද්ධියක් හෝ පුද්ගලයකු ඉලක්ක කර නොතිබිය යුතුය. සියලුම චරිත හා සිදුවීම් මනඃකල්පිත බවත්, සත්‍ය සිදුවීමකට හෝ පුද්ගලයකුට සම්බන්ධ නොවන බවත් දක්වා තිබිය යුතුය.

- ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාලය අපකීර්තියට ලක් වන ආකාරයේ කිසිදු දර්ශනයක් ඇතුළත් නොවිය යුතුය.

- සියලුම කෙටි චිත්‍රපට ඒවා ඉදිරිපත් කරන අය විසින් නිර්මාණය කරන ලද මූලකෘති විය යුතුය. සොරකම් කරන ලද නිර්මාණ ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

- නිර්මාණකරුවන්ට පටිගත කරන ලද හෝ රූගත කරන ලද සජීවී චරිත මෙන්ම පරිගණක හරහා නිර්මාණය කරන ලද චරිත හා දර්ශනද භාවිත කළ හැකිය.

- නිර්මාණකරුවන් විසින් සිය කෙටි චිත්‍රපට අන්තර්ගතයෙහි පිළිගත් චරිත දක්වන්නේ නම් අදාළ අයගෙන් පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

- කෙටි චිත්‍රපට සඳහා භාවිත කළ තෙවන පාර්ශ්වීය අන්තර්ගතවල මූලාශ්‍ර සියල්ල මනා ලෙස දැක්විය යුතුය.

**තාක්ෂණික නියමාවලිය:**

- කාලසීමාව: විනාඩි 3 සිට 5 දක්වා
- දෘශ්‍ය ආකෘතිය: High-definition (HD) (minimum 720p)
- දර්ශන අනුපාතය: 16:9 වඩාත් සුදුසු වේ
- ගොනු ආකෘතිය: MP4
- භාෂා : ඉංග්‍රීසි, සිංහල, දමිළ
- වෙනස් වූ ප්‍රේක්ෂකාගාරයක අවබෝධය සහතික කිරීම පිණිස දමිළ හා සිංහල කෙටි චිත්‍රපට සඳහා ඉංග්‍රීසි උපසිරැසි යෙදීම අවශ්‍ය වේ.

**භාරදීමේ ක්‍රියාපිළිවෙළ:**

- ඔබගේ කෙටි චිත්‍රපටය Google Drive ගොනුවක් වශයෙන් උඩුගත කර එම ගොනුවේ සබැඳිය (link) සංස්කරණ බලය පැවරීම සහිතව **2023.10.31 වන දින හෝ ඊට පෙර** sgbvc@gs.pdn.ac.lk විද්‍යුත් ලිපිනය වෙත එවන්න.

**ඇගයීමේ නිර්ණායක:**

- තේමාව හා අරමුණ සමග ගැළපීම
- නව්‍ය වෘත්තාන්තයක් වීම, නිර්මාණාත්මක ප්‍රකාශනය හා නිෂ්පාදන ගුණාත්මකභාවය
- අදාළ පණිවිඩය ප්‍රකාශ කිරීමෙහිලා සමස්ත බලපෑම හා ඵලදායීත්වය

**ඇගයීම් ක්‍රමවේදය:**

- ප්‍රවීණ තේරීම් මණ්ඩලයක් මගින් මූලික වටයේ තේරීම සිදු කෙරේ.
- මූලික වටයෙන් තෝරාගන්නා ලද කෙටි චිත්‍රපට විද්‍යාර්ථීන්ගේ ඡන්දය සඳහා SGBVC YouTube නාලිකාවේ පළ කරනු ලැබ සියයට 30ක ලකුණු ප්‍රමාණයක් ඉන් ගණනය කෙරේ.
- ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් විසින් සියයට 70ක ලකුණු ප්‍රමාණයක් ලබා දෙමින් ස්ථාන තෝරනු ලැබේ.

**විමසීම්:** sgbvc@gs.pdn.ac.lk විද්‍යුත් ලිපිනය මගින් හෝ +94771534879 අංකය හරහා දුරකතන හෝ WhatsApp මගින් විමසන්න,